




**ශ්‍රී. බු. ව. 2554 උඳුවප් මස කලාපය, රා. ව. 2010 ක් වූ දෙසැම්බර් මස 20 වන දින**
**වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති**

**. ටී ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**
***නමෝ තසස භගවතො අරහතො සමමා සමබුදධසස***
**ජරා, ව්‍යාධි, මරණ නම් වූ දේවදූතයින් මෙලොවදීම නුවණින් දකිමු**

ධර්මකාමී පින්වතුනි,

අද උඳුවප් මස පුර පොහොය දිනයයි. භික්ෂුණී ශාසනය ආරම්භ වීම සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ ඇතුලු 11 නමක් ශ්‍රී මහා බෝධි දක්ෂිණ ශාඛාව ශ්‍රී ලංකාවට වැඩම කිරීම වැනි ශාසනික වැදගත් කරුණු රාශියක් සිදු වූ දිනය යි. එමෙන්ම අප රටේ ශ්‍රී පාද වන්දනා සමය ආරම්භ වීම ද වැදගත් වේ. ආගමික නොවුවද මීට වසර 06 පෙර ක්‍රිස්තු වර්ෂ 2004 වසරේ දෙසැම්බර් 26 දිනට යෙදුන අද වැනි උඳුවප්පෝදිනක මහ මුහුද ගොඩ ගැලීමද සිදුවිය. එනමුත් ව්‍යවහාර සම්මත දිනය වශයෙන් දෙසැම්බර් 26 වන දින එම සිදුවීම වූ දිනසේ සැළකේ.

අද දහම් පණිවුඩයේ මාතෘකාව සඳහා පාදක කරගත්තේ සූත්‍රපිටකයේ අඬගුත්තර නිකායේ තික නිපාතයේ දේව දූත වගගයේ 07 වැනි සූත්‍රය යි. බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරද්දී භික්ෂුන් වහන්සේ අමතා "මහණෙනි දේව දූතයෝ තිදෙනෙකි ...." යි යනුවෙන්

අමතා දේශනාකළ එම දේශනය ප්‍රතිපත්ති පිරීමෙහි උනන්දු නොවීමත් දුගතිගාමී වන ආකාරය සහ එහි විපාක පැහැදිලි කිරීමත් සිදු කෙරේ.

මහණෙනි! සිතින් කයින් වචනින් යන තුන්දොරින් දුසිරිතෙහි යෙදී මරණයට පත් වූ කෙනෙකු අපාය හෙවත් නිරයෙහි උපදී එසේ උපන් නිරි සත්වයා ඒ ඒ කර්මයට හේතු දැක්වීමට නිරය පාලකයන් විසින් ඔවුන්ගේ අත්වලින් අල්ලා යමරජු වෙත රැගෙන ගොස් "දේවයිනි, මොහු මවට, පියාට, මහණ බමුණන්ට සහ කුලජ්‍යෙෂ්ඨයන්ට නොසලකා අහිතව කටයුතු කළ තිදොරින් දුසිරිත් කළ කෙනෙකි. මොහුට දඬුවම් ලබා දෙනු මැනවි" යනුවෙන් කියති.

යමරජු විසින් ඔහුගෙන් ප්‍රශ්න 03ක් අසයි. එනම්, පළමු දේව දූතයා තෝ දැක්කෙහිද? දෙවෙනි දේව දූතයා තෝ දැක්කෙහිද ? තුන්වෙනි දේව දූතයා තෝ දැක්කෙහිද? අවස්ථා 03 කට අසයි. එවිට ඊට පිළිතුරු වශයෙන් නිරය ගාමී සත්වයා අවස්ථා තුනේදීම වහන්ස ! නොදිටිමි යනුවෙන් පිළිතුරු දෙයි.

මහණෙනි පළමු දේවදූතයා පිළිබඳව විස්තර ඇතිව පැහැදිලි කරමින් මෙසේ යමරජු විසින් අසයිඃ "එම්බා පුරුෂය, තෝ මිනිසුන් අතර අසූ අනූ සියවස් ගිය දිරූ ශරීර ඇති නැමී සැරයටිය පිහිට කොට ගමන්කරන වෙව්ලමින් දත් සැලුන ඉදුනු කෙස් ඇති මුඩු හිස් ඇති ඇඟ රැළි ගැසුනු ලප කැළැල් ඇති ස්ත්‍රියක හෝ පුරුෂයෙකු නොදක්කෙහිද?" ඊට නිරයගාමී සත්වයා පිළිතුරු දෙනවා "ස්වාමීනි දිටිමි."

යමරජු ඔහුට මෙසේ කියයි. : "ඒ දකින විට තොපට මෙබඳු සිතක් නොවීද?, "මමත් ජරාවට පත්වෙනව ඒ තත්වයෙන් මිදීමට මට ද නොහැකිය . එය සවභාවයකි. මම සිතින්

කයින් වචනයෙන් යහපත් ගුණ ධර්ම පුරුදු කළොත් යහපතකි." යි. ඔහු ඊට පිළිතුරු වශයෙන් "එසේ සිතීමට නොහැකි වූයෙමි. මම ප්‍රමාද වීමි ස්වාමීනි !"

මහණෙනි පෙරකී පරිදි නැවත දෙවෙනි දේවදූතයා දුටුවෙහිදැ යි යමරජු විමසයි. එවිටද "වහන්ස නොදිටිමි." යමරජු ඔහුට විස්තර ඇතිව දේව දූත ලක්‍ෂණ මෙසේ පැහැදිලි කරයි. "එම්බා පුරුෂය තෝ මිනිසුන් අතර රෝගීව දුකට පත්ව දැඩිසේ ගිලන්ව මළ මුත්‍රා දෙකෙහිම ගැලී වැතිර තවත් කෙනෙකුගේ පිහිටෙන් නැගිටුවීම වැතිරවීම සිදුකරන රෝගී වූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු නොදිටී ද? හේ ඊට පිළිතුරු ලෙස "වහන්ස, දිටිමි" යි කීය. යමරජු මෙසේ කියයි. "එම්බා පුරුෂය තොපට මෙසේ නොසිතුනෙහිද? " මම ද ව්‍යාධිය නම් වූ ලෙඩ දුක් ස්වභාවයෙන්ම උරුමකර ඇත්තෙමි . එය ඉක්මවීමට මට ද නොහැකිය. ඒ නිසා මම කයින් වචනින් මනසින් කුසල් දහම් හි හැසිරෙමි" යි. ඊට පිළිතුරු මෙසේ කියයි. "වහන්ස, එසේ නොසිතුනෙමි ප්‍රමාදවීමි" යි කියයි.

නැවත යමරජු විසින් තුන්වෙනි දේව දූතයා දුටුවෙහි දැයි විමසූ විට නිරයගාමී සත්වයා "නොදිටිමි ස්වාමීනි" යනුවෙන් කලින් මෙන්ම අනවබෝධයෙන් පිළිතුරු දෙයි. යමරජු මෙසේ ඔහුට අවබෝධ පරිදි කියයි. "එම්බා පුරුෂය තෝ මිනිසුන් අතර ස්ත්‍රියක හෝ පුරුෂයෙකු මරණයට පත් වී එක්දිනක්, දෙදිනක්, තෙදිනක් හෝ ඉදිමී හෝ විශේෂයෙන් නීල වණී වූ ඕජා වැගිරෙන වූ තත්වයේ හෝ කෙනෙකුගේ මරණයට පත්වීමක් නොදක්නා ලද්දේ ද? තමන් ද මහලු බවට පත්වෙමින් රෝගීවෙමින් සිටියදී මෙවැනි අවස්ථාවක් නොදැක්කේ ද? "වහන්ස, දැක ඇතැ යි" පිළිතුරු කියති. නැවත යමරජු " එම්බා පුරුෂය එසේ දකිද් දී තොපට මෙසේ නොසිතුනේ ද? මම ද මරණය ස්වභාවයෙන්ම උරුම කෙනෙක්මි. එය ඉක්මවීමට මට ද නොහැකි ය. ඒ නිසා මම සිතින් කයින් වචනින් කුසල් දහම් කරමි, යි අසති ඊට පිළිතුරු වශයෙන් "වහන්ස නොහැකි වීමි, ප්‍රමාද වීමි" යි කීය .

යමරජු විසින් පළමු සහ දෙවෙනි සහ තෙවන දේව දූතයා පිළිබඳව කරුණු විභාග කොට ඒ අවස්ථා තුනේදීම නිරිසත්වයා "ස්වාමීනි දිටිමි ප්‍රමාද වීමියි" කී කළ මෙසේ යමරජු අවවාද කරන බවද බුදු හිමියන් භික්‍ෂූන් වහන්සේට වදාළහ. තවදුරටත් "එම්බා පුරුෂය ඒ ප්‍රමාද වීම නිසා තුන්දොරින් (සිතින්, කයින්. වචනින් ) කුසල් දහම් නොකළෙහි ය. එසේ පමාවූවෙකුට මෙන්

තොපට ද විපාක සිද්ධවේ. ඒ පාපකර්මය මව විසින් හෝ පියා විසින් හෝ සහෝදරයකු විසින් හෝ සහෝදරියක විසින් කරන ලද්දක් නොවේ. දෙවියන් විසින් මහණ බමුණන් විසින් කරන ලද්දක් නොවේ. තොප විසින්ම කරන ලද පාප කර්මයක් බැවින් මේ පාපකර්මයේ විපාක තොප විසින් ම විඳිය යුතුය" යි පවසා යමරජ නිහඬවෙයි. යනුවෙන් වදාරා මහණෙනි ! යමපාලකයෝ විසින් ඔහුට පඤ්චවිධ බන්ධන කම්කටොලු සිදුකරති. (දඬුවම්දෙති) කෙසේ ද යත් රත්වූ යකඩ හුල් දකුණත. වමත, දකුණුපය, වම්පය ගසති. පපුව මැදටද ගසා පංචවිධ දඬුවම් දෙති.

නැවතද ඒ නිරය පාලකයෝ එමනිරයගාමී සත්වයා කෙටේරියෙන් සහිනු ඇත. එහි දුක් දැඩිවදැනේ. කරන ලද පාප කර්මය ගෙවෙනතුරු ඔහු කළුරිය නොකරයි. නැවත හිස උඩු යටිකුරු කර වෑයෙන් සහිනු ලබයි. රථයෙහි බැඳ ගිනිගෙන දිළිසෙන ගිනිදැල් සහිත බිමෙහි එහෙ මෙහෙ ඇවිද්දවති. එසේ මහා ගිණිගත් අඟුරු පර්වතයකට නැග්ගවීම බැස්සවීම කරති. හිස උඩුයටිකුරුකර ඇවිලගත් රත්වූ ගිනිදැල් ඇති ලෝකුඹු යෙහි බහනු ලබයි. එහි පෙණ නැංවෙමින් පැසේ වරක් උඩට මතුවේ. වරක් යටට බසී. වරක් හරහටද යති. එහි දුක් කටුක ලෙස විඳී. ඒ පාපකර්ම විපාකය ගෙවෙනතුරු ඔහු කළුරිය නොකරයි. නැවත ද ඔහු ගෙන මහා නිරයෙහි බහති. ඒ නිරය සතර කොනකින් සහ දොරටු සතරකින් යුතුය. කොටස් කොට බෙදා ඇත. පවුරින් වටවී ඇත. එසේම යකඩ පටකින් වසන ලද්දේය. එහි බිමද යකඩින් නිමවී ඇත. දිළියෙන ගිනිදැල් පවතී. හාත්පසින් යොදුන් සියක් පුරා හැමවිටම පැතිර පවතී.

මෙසේ බුදුහිමියන් භික්ෂූන් වහන්සේ අමතා දේශනා කොට අවසානයේදී තවත් යමක් දේශනා කරති. මහණෙනි ! ඒ යමරජුට මෙවැනි සිතක්ද පහළ වේ.

"ලෝකයේ යමෙක් පාපකර්ම කරයි ද ඔවුහු මේ ආකාරයේ දඬුවම් ලබති. අහෝ ! මම මිනිසත් බවක් ලබන්නේ නම් අර්හත් සම්‍යක් සම්බුදුරජුන් වහන්සේ ලොව උපදීද මම ද ඒ බුදු හිමි ඇසුරු කරමි. උන්වහන්සේ මට දහම් දෙසයි නම් ඒ ධර්මය මට දැන ඉගෙන ගන්නට ලැබේනම් මහත්වූ යහපතකි" යි. වදාරා තව දුරටත් භික්ෂූන් වහන්සේ අමතා මහණෙනි, මා විසින් සර්වඥතා

ඥාණයෙන් දැනගන්නේ ද, දැක්කේ ද එසේ ප්‍රකට කොට දැන මම කියමි" යි ගාථා හතරක් ද වදාළ හ.

01. දේව දූත ලක්‍ෂණ දැක දැකත් යමෙක් මිනිස් ලොව දී ප්‍රමාද වේද හීන දීන ආත්ම ලබා ඒ මනුෂ්‍යයෝ බොහෝ කලක් ශෝක කරති.

02. මෙලොවදී දේව දූත ලක්‍ෂණ අවබෝධ කරගත් යම් ශාන්ත සත් පුරුෂ කෙනෙක් වෙත් ද, ඔහු ආර්‍ය්‍ය ධර්මයෙහි කිසිවිට පමා නොවේ.

03. ජාති සහ මරණ දෙකට හේතුවන ඉදුරන් පිනවීමෙහි ආදීනව බියදැක ජාති මරණ යන් දුරු කිරීමෙන් ලබන නිවන නිමිතිකොට මිදෙති.

04. මේ ආත්ම භාවයේදී ම කෙළෙස් නිවා නොපමාවූ ඒ නිසාම සුවපත් වූ සියලු භය ඉක්ම වූ ඔහු සියලු දුක් දිනුවා හු ය.

ඉහත විස්තර වූයේ කර්මවිපාකයන්ට අනුව නිරයෙහි උපන් සත්වයා එම විපාක ඔහු කරා පමුණුවන ආකාරයි. යමරජු පිළිබඳව ත් මෙහි දැක්වේ. ඔහු විමාන ප්‍රේතයෙකු ලෙස ධර්මයෙහි දැක්වේ. සමහර කලෙක පාප බලයෙන් නිරයෙහි දුක් අනුභව කරයි. සමහර කලෙක මෙසේ සත්වයන් විනිශ්චය කොට සුගති දුගතියට පමුණුවයි. එක් පුද්ගලයෙකු නොවන බවද දැක්වේ. ඔහු ලබා ඇති ඒ රජකම ද අකුසල් විපාක විඳීමකි.

එමෙන්ම සූත්‍රය අවසානයේ යමරජුට ද යහපත් වූ සිතක් පහළ වනබව දැක්වේ. තමන් සමීපයට ගෙන එන ලද නිරිසතුනට ජරා, ව්‍යාධි, මරණ වශයෙන් ත්‍රි විධ දේව දූතයන් යොදා "තෙපි මෙතෙක් කාරණා දැක දැකත් කුමට කුසල් නොකළා හු දැයි භය ගන්වා කළ පින් ඇත්තනම් එය සිහිපත් කරවති. එසේ සිහිපත් කළ කල්හි ඔවුහු නරකයෙන් මිදී සුගතියෙහි ඉපදීමට පසුබිම සකස් කරගනී.

කළ පින් නැත්තහු නම් "මේ පවුකම නොපි නොපිම කළාහුය එහි විපාකයන් නොපිම විඳුවයි. යමරජු නිශ්ශබ්ද වෙයි. මෙම විනිශ්චය කරන යමරජුට ද කර්ම වේගයට අනුව පූර්ව පුණ්‍ය චේතනාවන් පහළ වී "අහෝ වතාහං මනුස්සත්තං ලභෙය්‍යං..." යනාදී වශයෙන් මිනිසත් බවේ අගය සිහි කරයි.

ලෝ වැඩ සඟරා කතුවරයා ද මේ පිළිබඳව මෙසේ පවසත්.

ලොබේ සිතින් පව්කම් කළ   ත       වා

ඉබේ ඉන්ට නොමදී සිතු රඟ       වා

හබේ කියති ගෙන ගොස් යමරජු       වා

ලැබේ නිරා දුක් පැමිණී එවි       වා

ලෝභ චිත්තයෙන් යුක්තව පවුකම් කළ සත්වයන්ට සිත් වූ පරිදි නිකම් ඉන්ට ඉඩ නොදී යම දූතයෝ යමරජුවෙත අරගෙන ගොස් නඩු කියන්නාහු ය. එවිට පැමිණි නිරාදුක් විඳීමට සිදුවන්නේ ය.

මනුෂ්‍යත්වයේ වටිනාකම යමරජුට වැටහෙන බව සූත්‍රයේ දැක්වේ. උතුම් මිනිසත් බව ලබා ඇති අපට ද ගත හැකි පණිවිඩය ද එයයි. සූත්‍රයේ දැක්වෙන පරිදි දේව දූත ලක්ෂණ මෙලොවදීම පහළ වේ. ජරා ජීර්ණ භාවයට පත් වෙනවා යනු ලජ්ජාවිය යුතු කාරණයක් ලෙස ඇතැමුන් සිතති. වයසට ගොස් ජරාවට පත්වීම, ලෙඩවීම, මරණය නුවණින් දැකීම දේවදූත

යන වචනයෙන් බුදු දහම හඳුන්වයි. ඇසින් දැකීමට වඩා නුවණින් දැකීම උතුම් දැකීමයි. යෝනි සෝ මනසිකාරය යි. සූත්‍රයේ දැක්වෙන ජරා ලක්ෂණ වසාගන්න උපක්‍රම යෙදීම දේව දූත චෝදනාවට පිළිතුරු නොවේ. ව්‍යාධිය යනු ලෙඩ දුක් නැමති දේව දූතයාය.එය ජරා ධර්මය සේම දැනේ ඇතැම්හු එය ද ලජ්ජාවට කාරණා ලෙසින් සඟවති විශේෂයෙන් වර්තමානයේ පිළිකාව වැනි ලෙඩ බොහෝ දෙනා සඟවති. එය ලජ්ජාවට කාරණා ලෙසින් සිතති. එය ද

දේව දූත ලක්ෂණයක් සේ සලකා ලජ්ජාවීමට වඩා වපාධිය ස්වභාවයක් සේ නුවණින් දැකිය යුතුය.

මරණ ධර්මය ද නිතර අපට දැකීමට ඇසීමට ලැබේ. රජවරු බලවතුන්, දිළින්දන්, ධනවතුන් ආදී හැමදෙනාටම ද, තමන්ට ද එකසේ මුහුණ දීමට වන දේව දූත ලක්ෂණයකි. උපන් සත්වයා මේ දැක්වූ කරුණු තුනම ස්වභාවකොට ඇති බව අවබෝධ කරගත යුතුය.

සැපට ගිජුවූ සමහරු ලද සැපත කා බී නැටුම් ගැයුම් ආදියෙන් විනෝදය ඇතිකර ගනිමින් විඳිති. පිනකට දහමකට හිත නොයොදවති. අනුන්ගෙන් අසා දැනගෙනද නොකරති. දුසිරිතෙහි හැසිරේ දෙලොවම දුකට භාජන කර ගනිති.

බුදුහිමියන් පෙන්වා වදාළේ තමන්වහන්සේ විසින්ම දක්නා ලද දහමකි. කෙනෙකුගෙන් අසා දැනගෙන නොවේ. පෘථග්ජනවූ අපට එකවර තේරුම් ගැනීම ද අපහසුය. ඇතැමුන් අපාය , දෙව්ලොව ඇහැට නොපෙනන නිසා පිළිනොගනිති. ඒ සඳහා බුදු ගුණ, රහත් ගුණ පළමුවෙන් දැනඉගෙනගත යුතුය. ඒ ඍධිමත් දිවැස් ඇත්තෝ පව්කළ වුන් නිරාදුක් විඳින හැටි දකිති.

සසුනෙහි පැවිදිවූ මිලක්ඛ තිස්ස නම් ස්වාමීන් වහන්සේ දිනක් දේව දූත සූත්‍රයේ "තමේනං භික්ඛවේ නිරයපාලා, පුන මහා නිරයේ පක්ඛි පනති... "(මහණෙනි, යම පල්හු නැවත ඔහු මහා නිරයෙහි ප්‍රක්ෂේප කෙරෙත්") යනවාක්‍ය අසා නිරාදුක පිළිබඳ  බිය ඇතිව එහි දරුණුකම පිළිබඳව තම ලොකු හාමුදුරුවන් ගෙන් ඇසූහ. එහි දරුණුකම දැනගන්නට එක කාරණයක් පෙන්විය හැකියයි කියූ මහ තෙරුන් වහන්සේ සාමණේර හිමි වරුන් හවුල් කරවාගෙන ගලක් මතුපිට අමුදරු ගොඩක් ගසන්නට කීය. කුඩා හිමිවරුන් එසේ කළවිට මහ තෙරුන් වහන්සේ ඍධි බලයෙන් නිරයෙන් කණ මැදිරියකු පමණ ගිනි පුපුරක් අවුත් ඒ දරමත වැටෙන්නට සැළැස්වී ය. මොහොතකින් දරගොඩ දා අළුවී ගියේ ය. නිරාබිය ඇති වී තැතිගත් උන්වහන්සේ මහතෙරුන් වහන්සේගෙන් කමටහන් ලබා වීයඵී වඩා රහත්වූ බව දැක්වේ. මේ ආදීන් සලකා බලා මෙලොවත් පිරිහී පරලොවද නිරාදුකට භාජනය වන

*සිතින් කයින් වචනයෙන් වන අකුසල් වලින් වැළකී දාන ශීලාදී පින්කම්හි යෙදෙමින් සගමොක් සුව සලසා ගන්නට සැවොම සිත්හි දරාගත යුතුය.*